# ලංකා බැංකුව

**ශ්‍රී ලංකාවේ "අංක 01" බැංකුව හා එක්ව ඔබේ නීති වෘත්තිය ගොඩනගා ගන්න !**

බැංකුවේ නීති අංශයේ වෘත්තියක් කර ඉන් ඉදිරියට යාමට අපේක්ෂාකරන සුදුසුකම් ලත්, තරුණ, උද්‍යෝගිමත් අරමුණු හඹායන පුද්ගලයන්ගෙන් පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:

# අභ්‍යාසලාභී සහකාර නීති නිලධාරී

**(විශේෂයෙන්ම අනුරාධපුර, පොළොන්නරුව සහ කෑගල්ල යන ප්‍රදේශවල පුරප්පාඩු පවතී)**

## ප්‍රධාන වගකීම්

- ➢ නිශ්චල දේපළවල හිමිකම් පරීක්ෂා කිරීම
- ➢ උකස් බැඳුම්කර සහ අදාළ වෙනත් ඔප්පු සහ ලේඛන කෙටුම්පත් කිරීම සහ සහතික කිරීම
- ➢ නීති මූලධර්ම මත පදනම්ව උපදෙස් සහ අදහස් ලබා දීම
- ➢ අධිකරණවල පෙනී සිටීම, නඩු කටයුතු සම්බන්ධයෙන් පැමිණිලි, මෝසම් සහ අදාළ වෙනත් ලේඛන කෙටුම්පත් කිරීම

## යෝග්‍යතා නිර්ණායක

- ➢ ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- ➢ **සුදුසුකම්**

  නීතිඥවරයකු සහ ඉංග්‍රීසි භාෂාවෙන් වෘත්තියේ නියැලීමට බලපත්‍රයක් සතුවන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වීම
- ➢ **පළපුරුද්ද**

  අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද

  බැංකු හෝ වෙනත් මූල්‍ය ආයතනවල පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත
- ➢ **වෙනත් සුදුසුකම්**
  - ● පරිගණක සාක්ෂරතාව සහ සුවිශේෂී සන්නිවේදන කුසලතා
  - ● ස්වාධීනව වැඩ කටයුතු කිරීමේ හැකියාව
- ➢ **වයස**

  අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 32ක් හෝ ඊට අඩු විය යුතුය.

## නියමයන් සහ කොන්දේසි

- ➢ පුහුණු කාල සීමාව වසර දෙකක් (02) වන අතර පුහුණු කාලය තුළ (පළමු වසර සඳහා – මසකට රු.90,000/– බැගින් හා දෙවන වසර සඳහා – මසකට රු. 100,000/– බැගින්) මාසික දීමනාවක්ගෙවනු ලැබේ.
- ➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- ➢ පුහුණු කාලය අවසානයේදී බැංකුව විසින් පවත්වනු ලබන විශේෂ විභාගයකදී සුදුසු බව පෙනී ගියහොත් සහ පුහුණු කාලය තුළ සාමාන්‍ය හැසිරීම සතුටුදායක නම්, ස්ථිර කාර්ය මණ්ඩලයේ සහකාර නීති නිලධාරී ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබේ.
- ➢ කාර්යාල වේලාවට අමතරව හා අවශ්‍ය වූ විට සති අන්තයේ/නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.
- ➢ බැංකුවේ අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- ➢ විශේෂ ප්‍රදේශ සඳහා (එනම්, අනුරාධපුර, පොළොන්නරුව සහ කෑගල්ල) තෝරාගනු ලබන අපේක්ෂකයන් සතුව අදාළ අධිකරණ බල ප්‍රදේශය සඳහා ඔවුන්ගේ නොතාරිස් බලපත්‍ර තිබිය යුතුය.

## තෝරා ගැනීමේ පටිපාටිය

කෙටි ලැයිස්තුගත කරනු ලබන (shortlisted) අපේක්ෂකයන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන **www.boc.lk ("careers"** නිරය) හරහා 2025 පෙබරවාරි මස 22 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන්න. ඉදිරි කටයුතු සඳහා "**ඉල්ලුම්පතේ යොමු අංකය**" ඔබේ ළඟ තබාගන්න.

ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම ඉල්ලුම්පතක් කිසිදු දැනුම් දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරු විසින් අපගේ වෙබ් අඩවියේ **https://www.boc.lk/hr-management** ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ ඇති "**බඳවා ගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම**" ඉල්ලුම් කරන අවස්ථාවේදී කියවා අවබෝධ කර ගත යුතුය.

කරුණාකර Careers පිටුවේ ඇති 'අපේක්ෂකයන් සඳහා වන උපදෙස්' පරීක්ෂාවෙන් කියවා දී ඇති උපදෙස් අනුව මාර්ගගත ඉල්ලුම්පත සම්පූර්ණ කරන්න.

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**කොළඹ 01.**

- ▪ බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.
- ▪ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- ▪ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවාගැනීම් කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- ▪ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

1975 BOC
www.boc.lk
A (lka) Fitch ...
https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC